# සියළුම ශ්‍රී ලාංකිකයන් වෙත කෙරෙන නිවේදනයයි.

විදේශයන්හි නේවාසිකව සිටින ශ්‍රී ලාංකික ප්‍රජාවගේ දරුවන් සඳහා අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් ශක්‍යතා අධ්‍යයනයක ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වර්තමානයේ නිරතව ඇත.

ඒ අනුව ප්‍රථමකොට මෙකී යෝජනාව ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සලකා බැලීම පිණිස ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින්, විදේශ කටයුතු අමාත්‍යාංශය මගින් 2018 වසරේ දෙසැම්බර් මස පැවැත්වීමට නියමිත අ.පො.ස (සා.පෙළ) විභාගයට පෙනී සිටීමට අදහස් කරන අයදුම්කරුවන්ගේ නේවාසික නගරය, ස්ත්‍රී පුරුෂ භාවය, වයස, විෂයයන් (අ.පො.ස. සා.පෙළ සඳහා නිර්දේශිත සියළුම විෂයන්ද නැතහොත් එයින් බාණ්ඩයක් සඳහා පමණක්ද යන්න) සහ මාධ්‍ය (සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි) සඳහන් කරමින් අපේක්ෂකයන්ගේ ජීව දත්ත වාර්තාවක් කැඳවා ඇත.

මෙකී යෝජනාව ක්‍රියාත්මක වුවහොත්, විභාගයට පෙනී සිටීමට අදහස් කරන අපේක්ෂකයන්ගෙන් විභාගය පැවැත්වීම සඳහා වන සියළුම ගාස්තු අයකර ගැනීමට යටත්ව අ.පො.ස. (සා.පෙළ) විභාගය ඩුබායි හි හෝ අනෙක් සුදුසු නගරයක පැවැත්වීම සඳහා සියළු කටයුතු යෙදීමට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව අපේක්ෂා කරයි. ඒ අනුව 2018 වසරේ දෙසැම්බර් මස පැවැත්වීමට නියමිත අ.පො.ස (සා.පෙළ) විභාගය සඳහා අයදුම් කිරීමට බලාපොරොත්තුවන ඩුබායි සහ උතුරු එමීරයන්හි නේවාසික අයදුම්කරුවන් සිටීනම් තමන්ගේ තොරතුරු exams@doenets.lk යන විද්‍යුත් තැපැල් ලිපිනයට slcg.dubai@mfa.gov.lk යන ලිපිනයටද පිටපතක් සහිතව යොමු කරන මෙන් දන්වා සිටිමු.

මේ පිළිබඳව වැඩිදුර තොරතුරු ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ පහත සඳහන් දුරකථන අංක, ෆැක්ස් අංකය සහ විද්‍යුත් තැපැල් ලිපිනය ඔස්සේ ලබාගත හැකි බව තවදුරටත් දන්වා සිටිමු.

දුරකථන අංක :-

0094 112 784 201, 0094 112 784 204, 0094 112 784 206, 0094 112 785 202,
0094 112 786 200, 0094 112 786 205, 0094 112 784 207

ෆැක්ස් :- 0094 112 785220

විද්‍යුත තැපැල : - exams@doenets.lk